# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 40 දරන
# මෝටර් වාහන (සංශෝධන)
# පනත

[සහතිකය සටහන් කළේ 1984 ඔක්තෝබර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1984 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 1.05 යි          තැපැල් ගාස්තුව : ශත 90 යි

# 1984 අංක 40 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ඔක්තෝබර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ.30/83

මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 40 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෝටර් වාහන පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි "මෝටර් කෝච් රථයක්, මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හෝ ලොරියක් නොවන යම් මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "යම් මෝටර් වාහනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 203 වන අධිකාරයේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(i) එම උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේද පිළිවෙලින් (ආ) සහ (ඇ) යන ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(ii) එම උපවගන්තියේ නැවත අක්ෂර යොදනු ලැබූ (ආ) ඡේදයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අ) ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ යම් පංතිය කට අයත් වාහන ධාවනය කිරීම සම්බන්ධයෙන් ද, ඒ පංතියට අයත් වාහන ධාවනය කිරීමට ඉල්ලුම්කරු කායික වශයෙන් සුදුසු බවට වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයකුගෙන් ලබාගත් සහතිකයක්" ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "වෛද්‍ය ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ආසාදන හෝ බෝවන ස්වභාවයේ වූ යම් රෝගය කින් පෙළීමේ හේතුව නිසා හෝ බලපත්‍රය දරන්නා අපරාධ වැලැක් වීමේ ආඥාපනතේ අර්ථානුකූලව ලේඛනගත අපරාධකරුවකුවීමේ ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

හේතුව නිසා හෝ" යන වචන වෙනුවට "ආසාදන හෝ බෝවන ස්වභාවයේ වූ යම් රෝගයකින් පෙලීමේ හේතුව නිසා හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ VII අ අලුත් කොටස ඇතුළත් කිරීම.

6. පහත දැක්වෙන අලුත් කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන කොටසට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII අ කොටස වශයෙන් බලාත්මක විය යුතු ය:—

'VII අ කොටස

රිය පැදවීමේ උපදේශකයන්ට බලපත්‍ර දීම.

139අ. (1) කොමසාරිස්වරයා විසින්, රිය පැදවීමේ උපදේශකයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සහ තත් කාලයෙහි බලාත්මකව පවත්නා (මෙහි මින්මතු "උපදේශක බලපත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රයක අධිකාරය යටතේ සහ එහි නියම හා කොන්දේසි අනුව හැර, කිසිම තැනැත්තකු විසින්, අදාළ දිනයේ දී හෝ ඉන් පසුව, රිය පැදවීමේ උපදේශකයකු වශයෙන් ක්‍රියා නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

උපදේශක බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය.

139ආ. (1) උපදේශක බලපත්‍රයක් සඳහා සෑම ඉල්ලුම් පත්‍රයක් ම, නියම කරනු ලබන ආකෘතියෙහි, නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට, නියම කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව සමග කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් තැනැත්තකු—

(අ) වලංගු රියදුරු බලපත්‍රයක් දරන්නේ නම් මිස ; සහ

(ආ) නියම කරනු ලබන යෝග්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුව සිටී නම් මිස,

ඔහුට උපදේශක බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(3) මෝටර් වාහන පැදවීමේ ලා උපදෙස් දීමේ දී උසස් සම්මතයන් පවත්වා ගෙන යාම සහතික කරනු පිණිස අවශ්‍ය යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන නියම හා කොන්දේසිවලට උපදේශක බලපත්‍රයක් යටත් විය යුතු ය.

(4) තම උපදේශක බලපත්‍රයේ නියම හෝ කොන්දේසි අතුරෙන් යම් නියමයක් හෝ කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින රිය පැදවීමේ උපදේශකයෙක්, 139ඉ වගන්තිය යටතේ තම බලපත්‍රය අවලංගු කරනු ලැබීමට හෝ අත්හිටවනු ලැබීමට යටත් වීමට අතිරේකව, මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

උපදේශක බලපත්‍රය බලපවත්නා කාලය ආදිය.

139ඇ. (1) නියම කරනු ලබන ගාස්තුවක් හෝ ගාස්තු යම් තැනැත්තකු විසින් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබූ විට හැර, කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත මේ කොටස යටතේ උපදේශක බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(2) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම උපදේශක බලපත්‍රයක්ම, (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, නියම කරනු ලබන ගාස්තුව ගෙවූ විට, වරකට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා එවැනි සෑම බලපත්‍රයක් ම අලුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ කොටසේ පසුව සඳහන් වන විධිවිධාන යටතේ අවලංගු කරනු ලබන උපදේශක බලපත්‍රයක බලාත්මකතාව එය අවලංගු කරනු ලැබූ දින අවසන් විය යුතුය.

(4) මේ කොටසේ පසුව සඳහන් වන විධිවිධාන යටතේ යම් කාලසීමාවක් සඳහා අත්හිටවනු ලබන උපදේශක බලපත්‍රයක්, ඒ අත්හිටවනු ලැබූ කාලසීමාව තුළ දී, බලාත්මක නොවිය යුතු ය.

උපදේශක බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම ඉල්ලුම්කරුට හෝ බලපත්‍රය දරන්නාට දැනුම් දිය යුතු බව.

139ඈ. 139ආ වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ දක්වා ඇති හෝ ඒ උපවගන්ති යටතේ වූ නියම අතුරින් යම් නියමයක්, උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරු විසින් හෝ උපදේශක බලපත්‍රයක් දරන්නා විසින් සපුරාලීමට අපොහොසත් වීමේ හේතුව මත, උපදේශක බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ලිඛිත ප්‍රකාශයක්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ බලපත්‍රය දරන්නාට භාරදීම හෝ භාර දීමට සැලැස්වීම කළ යුතු ය. ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතුවූ කරුණු ප්‍රකාශයෙහි දැක්විය යුතු ය.

3—ඒ 077521 (84/06)

උපදේශක බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

139ඉ. (1) රිය පැදවීමේ උපදේශකයා--

(අ) මේ කොටසේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගවලට පටහැනිව තම උපදේශක බලපත්‍රය අනිසි ලෙස ලබාගෙන තිබෙන බවට;

(ආ) තම ක්‍රියාකලාපය හෝ ශාරීරික අබලතාව හේතුකොටගෙන උපදේශක බලපත්‍රයක් දිගටම දැරීම සඳහා තවදුරටත් සුදුසු හා නිසි තැනැත්තකු නොවන බවට; හෝ

(ඇ) තම බලපත්‍රයේ නියම හෝ කොන්දේසි අතුරින් යම් නියමයක් හෝ කොන්දේසියක් නැතහොත් මේ කොටසේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග අතුරින් යම් නියෝගයක් උල්ලංඝනය කරන බවට හෝ උල්ලංඝනය කර ඇති බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් උපදේශක බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම කළ හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට පෙර, එසේ කිරීම සඳහා වූ තම අදහස පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලබන දිනය වශයෙන්, දැන්වීමේ දිනට පසුව දින දාහතරකට නොඅඩු දිනයක් නියම කරමින් ද, තම බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම නොකළ යුත්තේ මන්දැයි කොමසාරිස්වරයා වෙත හේතු දක්වන මෙන් අදාළ රිය පැදවීමේ උපදේශකයාගෙන් ඉල්ලා සිටිමින් ද රිය පැදවීමේ උපදේශකයා වෙත දිය යුතු ය.

(3) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගුකිරීම හෝ අත්හිටුවීම කර ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් අදාළ රිය පැදවීමේ උපදේශකයා වෙත වහාම දැනුම් දිය යුතු ය.

(4) රිය පැදවීමේ උපදේශකයකු විසින්, (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීම් ලැබී දින දහතරක් ඇතුළත, ඒ අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(5) අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ නියමයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් අදාළ රිය පැදවීමේ උපදේශකයා වෙත දැනුම් දීමෙන් පසුව දින දාහතරක කාලසීමාවක් ඉකුත් වන තුරු එම නියමය බලාත්මක නොවිය යුතු ය.

(6) එම කාලසීමාව ඇතුළත, අදාළ රිය පැදවීමේ උපදේශකයා විසින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබුව හොත්, ලේකම්වරයා විසින් ඒ නියමය ස්ථිර කිරීම හෝ ලේකම්වරයා විසින් යම් හේතුවක් නිසා අභියාචනය නිෂ්ප්‍රභ කිරීම කරනු ලබන තුරු නියමය බලාත්මක නොවිය යුතු ය.

(7) අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ නියමයක් (5) වන උපවගන්තිය යටතේ බලාත්මක වන අවස්ථාවක, අදාළ රිය පැදවීමේ උපදේශකයා විසින් එම නියමය බලාත්මක වූ දින සිට, මෝටර් වාහනයක් පැදවීමෙහි ලා යම් තැනැත්තකුට උපදෙස් දීම අවසන් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ උපදේශක බලපත්‍රය අවලංගු කරනු ලැබූ රිය පැදවීමේ උපදේශකයකු විසින් වහාම එම බලපත්‍රය කොමසාරිස්වරයා වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

රිය පැදවීමේ පාසැල් වලට බලපත්‍ර දීම.

139ඊ. (1) කොමසාරිස්වරයා විසින් මේ කොටස යටතේ ඒ සඳහා නිකුත් කරනු ලැබුවා වූද, තත් කාලයේදී බලාත්මකව පවතින්නාවූ ද (මෙහි මින්මතු "රිය පැදවීමේ පාසැල් බලපත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රයක අධිකාරය යටතේ සහ එහි නියම හා කොන්දේසි අනුව හැර, කිසිම තැනැත්තකු විසින් අදාළ දින හෝ ඊට පසුව රිය පැදවීමේ පාසැලක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) තැනැත්තකු විසින් මෝටර් වාහනයක් පැදවීමෙහි ලා තැනැත්තන්ට උපදෙස් දීම පිණිස වෙනත් තැනැත්තන් හෝ අනුයෝජිතයන් යොදවා ගැනීම හෝ සේවයෙහි නියුක්ත කිරීම කරනු ලබන්නේ නම්, එම තැනැත්තා විසින් රිය පැදවීමේ පාසැලක් පිළිබඳ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමේ හෝ ඒවා අනුව ක්‍රියා කිරීම පැහැර හැරීමේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නොඅඩු දඩයකට හෝ මාස

ගයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

රිය පැදවීමේ පාසැල් සඳහා ඉල්ලුම් පත්‍රය.

139උ. (1) රිය පැදවීමේ පාසැලක් සඳහා සෑම ඉල්ලුම් පත්‍රයක්ම, නියම කරනු ලබන ආකෘති යෙහි, නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට, නියම කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව සමග කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) පහත දැක්වෙන කරුණු ඇතිනම් මිස, රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් කිසිම තැනැත්තකු වෙත නිකුත් නොකළ යුතු ය:—

(අ) රිය පැදවීමේ පාසැලේ රිය පැදවීමේ උපදෙස් දීම සහ රිය පැදවීමේ පරීක්ෂණ සඳහා පාවිච්චියට ගනු ලැබීම පිණිස නියමිත වර්ගයේ මෝටර් වාහන සන්තකයේ තිබීම හෝ තමාට ලබාගත හැකිව තිබීම ; සහ

(ආ) රිය පැදවීමේ පාසැල නියම හෝ සතුටුදායක ආකාරයකින් පවත්වාගෙන යාමටත්, එම පාසැලේ බලපත්‍රලත් රිය පැදවීමේ උප දේශකයන් සේවා නියුක්තියෙහි යෙදවීමටත් පහසුකම් තිබීම.

(3) රිය පැදවීමේ පාසැල්වල කටයුතු කරගෙන යාමේදී උසස් සම්මතයන් පවත්වාගෙන යාම සහතික කරනු පිණිස අවශ්‍ය යයි කොමසාරිස් වරයා විසින් සලකනු ලබන නියම හා කොන් දේසිවලට රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් යටත් විය යුතුය.

රිය පැදවීමේ පාසැල් බලපත්‍රය බලපවත්නා කාලය ආදිය.

139ඌ. (1) නියම කරනු ලබන ගාස්තුවක් හෝ ගාස්තු යම් තැනැත්තකු විසින් කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබූ විට හැර, කොමසාරිස් වරයා විසින් ඒ තැනැත්තා වෙත මේ කොටස යටතේ රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(2) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක්ම, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, නියම කරනු ලබන ගාස්තුව ගෙවනු ලැබූ විට, වරකට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා එවැනි සෑම බලපත්‍රයක්ම අලුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ කොටසේ පසුව සඳහන් වන විධිවිධාන යටතේ අවලංගු කරනු ලබන රිය පැදවීමේ පාසැල් බලපත්‍රයේ බලාත්මකභාවය, එය අවලංගු කරනු ලැබූ දින අවසන් විය යුතු ය.

රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම ඉල්ලුම්කරුට හෝ බලපත්‍රය දරන්නාට දැනුම් දිය යුතු බව.

139ඒ. 139ඩී වගන්තියේ (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ දක්වා ඇති හෝ ඒවා යටතේ වූ නියමයන් අතුරින් යම් නියමයක්, රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරු විසින් හෝ එවැනි බලපත්‍රයක් දරන්නා විසින් සපුරාලීමට අපොහොසත් වීමේ හේතුව මත, රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ වූ ලිඛිත ප්‍රකාශයක්, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ බලපත්‍රය දරන්නාට භාරදීම හෝ භාර දීමට සැලැස්වීම කළ යුතු ය. ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු ප්‍රකාශයෙහි දැක්විය යුතු ය.

රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් අවලංගු කිරීම.

139ඔ. (1) රිය පැදවීමේ පාසැලේ අයිතිකරු විසින්—

(අ) රිය පැදවීමේ පාසැල අනිසි හෝ අසතුටුදායක ආකාරයකින් පවත්වාගෙන ගොස් ඇති බවට;

(ආ) රිය පැදවීමේ පාසැල් බලපත්‍රය නිකුත් කරනු ලැබූ නියම හෝ කොන්දේසි අතුරෙන් යම් නියමයක් හෝ කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට ; හෝ

(ඇ) මේ පනත හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග යටතේ වූ යම් වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට

කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් රිය පැදවීමේ පාසැල් බලපත්‍රය අවලංගු කළ හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර, එසේ කිරීම සඳහා වූ තම අදහස පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක්, එවැනි අවලංගු කිරීමක් කරනු ලබන දිනය වශයෙන්, දැන්වීමේ දිනට පසුව දින දාහතරකට නො අඩු දිනයක් නියම කරමින් ද, තම බලපත්‍රය අවලංගු කිරීම නොකළ යුත්තේ මන්දැයි කොමසාරිස්වරයා වෙත හේතු දක්වන මෙන් අදාල රිය පැදවීමේ පාසැලේ අයිතිකරුගෙන් ඉල්ලා සිටිමින් ද රිය පැදවීමේ පාසැලේ අයිතිකරු වෙත දිය යුතු ය.

(3) කොමසාරිස්වරයා විසින් (1) වන උප වගන්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ අවලංගු කිරීම ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් අදාළ රිය පැදවීමේ පාසැලේ අයිතිකරු වෙත වහාම දැනුම් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීම ලැබී දින දාහතරක් ඇතුළත, ඒ අවලංගු කිරීමට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(5) අවලංගු කිරීමේ නියමය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් අදාළ රිය පැදවීමේ පාසැලේ අයිතිකරු වෙත දැනුම් දීමෙන් පසුව දින දාහතරක කාලසීමාවක් ඉකුත් වන තුරු එම නියමය බලාත්මක නොවිය යුතු ය.

(6) එම කාලසීමාව ඇතුළත, අදාළ රිය පැදවීමේ පාසැලේ අයිතිකරු විසින්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලබන්නේ නම්, ලේකම්වරයා විසින් ඒ නියමය ස්ථිර කිරීම හෝ ලේකම්වරයා විසින් යම් හේතුවක් නිසා එම අභියාචනය නිෂ්ප්‍රභ කිරීම කරනු ලබන තුරු නියමය බලාත්මක නොවිය යුතු ය.

(7) අවලංගු කිරීමේ නියමයක් (5) වන උපවගන්තිය යටතේ බලාත්මක වන අවස්ථාවක, අදාළ රිය පැදවීමේ පාසැලේ අයිතිකරු විසින්, එම නියමය බලාත්මක වූ දින සිට රිය පැදවීමේ පාසැලක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම අවසන් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ රිය පැදවීමේ පාසැල් බලපත්‍රය අවලංගු කරනු ලැබූ රිය පැදවීමේ පාසැලේ අයිතිකරු විසින් වහාම එම බලපත්‍රය කොමසාරිස්වරයා වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු ය.

මේ කොටස යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනය කිරීම.

139ඕ. මේ කොටස යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ලිඛිත දැනුම් දීමෙන් දින දාහතරක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

මේ කොටසේ කාර්ය සඳහා නියෝග.

139ක. පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඒවා අතුරින් යම් කාරණයක් සඳහා නැතහොත් ඒ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) මේ කොටසෙහි නියම කරනු ලැබිය යුතු යයි ප්‍රකාශිත හෝ නියමිත සියලුම කාරණා ;

(ආ) උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම පිණිස යෝග්‍යතාව සම්බන්ධයෙන් අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද නියම කිරීම ;

(ඇ) රිය පැදවීමේ උපදෙස් දීම හා රිය පැදවීමේ පරීක්ෂණ සඳහා පාවිච්චි කරනු ලැබිය හැකි මෝටර් වාහන වර්ගය සහ ඒ වාහන එසේ පාවිච්චි කරනු ලැබීමට පෙර පිළිපැදිය යුතු කොන්දේසි නියම කිරීම ;

(ඈ) උපදෙස් දෙනු ලබන විට රිය පැදවීමේ උප දේශකයන්ගේ ක්‍රියා කලාපය විධිමත් කිරීම ;

(ඉ) රිය පැදවීමේ පාසැල්වල කටයුතු විධිමත් කිරීම සහ රිය පැදවීමේ පාසැල් පවත්වා ගෙන යනු ලැබිය යුතු ආකාරය නියම කිරීම ; සහ

(ඊ) රිය පැදවීමේ උපදේශකයන් සහ රිය පැද වීමේ පාසැල් විසින් තබාගත යුතු වාර්තා වල ආකෘතිය සහ ඒ වාර්තාවල ඇතුළත් කළයුතු රිය පැදවීමේ උපදේශකයන්ගේ හා රිය පැදවීමේ පාසැල්වල විස්තර නියම කිරීම.

අර්ථ නිරූපණය.

139ග. මේ කොටසෙහි—

"රිය පැදවීමේ උපදේශක" යන්නෙන්, ගාස්තු වක් හෝ ත්‍යාගයක් සඳහා මෝටර් වාහනයක් පැදවීමෙහිලා උපදෙස් දෙන තැනැත්තකු අදහස් කෙරෙන නමුදු, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක උපදේශකයකු වශ යෙන් ක්‍රියා කරන තැනැත්තකු ඊට ඇතුළත් නොවේ ;

"රිය පැදවීමේ පාසැල" යන්නෙන්, ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා මෝටර් වාහන පැද වීම සම්බන්ධයෙන් තැනැත්තන්ට උප දෙස් දෙන ආයතනයක් අදහස් කෙරෙන නමුදු, ආණ්ඩුවේ දෙපාර්ත මේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් පවත්වාගෙන යනු ලබන රිය පැද වීමේ පාසැලක් ඊට ඇතුළත් නොවේ ; තවද

"අදාළ දිනය" යන්නෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මේ කොටසේ කාර්ය සඳහා අදාළ දිනය වශයෙන් නියම කරනු ලැබූ දිනය අදහස් කෙරේ.

අන්තර්කාලීන විධිවිධාන.

130ට. මේ කොටසේ කිසිවක් අඩංගු වුවද, අදාළ දිනට පෙරාතුවම—

(අ) රිය පැදවීමේ උපදේශකයකු වශයෙන් ක්‍රියා කරනු ලැබූ; හෝ

(ආ) රිය පැදවීමේ පාසැලක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබූ

යම් තැනැත්තකු විසින්, අදාළ දිනයේ සිට ආරම්භ වන මාස තුනක කාලසීමාව ඉකුත් වීමට පෙර, අවස්ථාවෝචිත පරිදි, උපදේශක බලපත්‍රයක් සඳහා හෝ රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරනු ලබන්නේ නම්, බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අවසාන වශයෙන් ප්‍රතික්ෂේප කිරීම හෝ ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස් කර ගැනීම කරනු ලබන තුරු, එම කාලසීමාව සඳහා උපදේශක බලපත්‍රයක් නොමැතිව එසේ කටයුතු කරගෙන යාමට හෝ රිය පැදවීමේ පාසැල් බලපත්‍රයක් නොමැතිව එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(14) යම් ස්ථානයක සිට මහා මාර්ගයකට යන මෝටර් වාහනයක් නැවතීම සඳහා ඉරි පාට කර ඇති තැනක ඒ මහා මාර්ගයට ඇතුළුවීමට පෙර නවත්වනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1අ) උපවගන්තියේ "කුලී මෝටර් වාහනයක් හෝ වෙනත් යම් වාහනයක්" යන වචන වෙනුවට "හෝ වෙනත් යම් මෝටර් වාහනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (1ආ) වන උපවගන්තියේ—

(i) එම උපවගන්තියේ (අ) ඡේදයේ "මත්පැන් පානය කොට ඇත්තේ ද යන වගට ප්‍රශ්වාස පරීක්ෂණය කට වහාම භාජන වන ලෙස, ඒ පොලිස් නිලධරයා විසින්, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා ඒ නියමයට අනුව ක්‍රියා කළ යුතු ය" යන වචන වෙනුවට "මත්පැන් පානය කොට ඇත්තේ ද යන වගට ප්‍රශ්වාස පරීක්ෂණ

යකට හෝ ඒ තැනැත්තා මත්පැන් ගෙන ඇත්තේ දැයි නිශ්චය කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිල ධරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට හෝ වහාම භාජන වන ලෙස, ඒ පොලිස් නිලධරයා විසින්, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි එවැනි යම් නියමයකට අනුව ක්‍රියා කළ යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එම උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දක් වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ඒ තැනැත්තා මත්පැන් ගෙන ඇති බව මත්පැන් ප්‍රශ්වාස පරීක්ෂණයකින් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු විසින් පවත් වනු ලබන පරීක්ෂණයකින් හෙළිවන්නා වූ අවස්ථාවක හෝ එවැනි යම් පරීක්ෂණයකට භාජනයවීමට ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ අවස්ථාවක පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා මත්පැන් ගෙන ඇති බව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.";

(iii) එම උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දක් වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියදුරු මත්පැන් හෝ මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට වූ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ වාර්තාව, පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා මත්පැන් හෝ මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට ප්‍රමාණ වත් සාක්ෂි විය යුතු ය"; සහ

(iv) එම උපවගන්තියේ (ඉ) ඡේදයේ "මත්ද්‍රව්‍ය ගැනී මෙන්" යන වචන වෙනුවට "මත්පැන් හෝ මත් ද්‍රව්‍ය ගැනීමෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එම වගන්තියේ (1ඇ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ;

"(1ඇඇ) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලැබූ බව විශ්වාස කිරීම සඳහා පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ තැනැත්තා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැබිය හැකි ය."; සහ

(ඇ) එම වගන්තියේ (1ඇ) උපවගන්තියේ (iii) වන ඡේදයේ "මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන තිබේද" යන වචන වෙනුවට "මත්පැන් හෝ මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන තිබේ ද" යන වචන ආදේශ කිරීමෙන්

ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) මෝටර් සයිකලයක් පදවන තැනැත්තා (2) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වර්ග යකට අයත් ආරක්ෂණ හිස් වැස්මක් පැළඳ නොසිටින වෙනත් යම් තැනැත්තකු තම මෝටර් සයිකලයෙහි රැගෙන යන අවස් ථාවක, පදවන තැනැත්තා සහ ඒ තැනැත්තා යන දෙදෙනා ම මේ පනත යටතේ වරදකට වරදකරුවන් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 160අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**10.** පහත දැක්වෙන අලුත් වගන්තිය 160 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 160අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"මාර්ග අළුත් වැඩියාවන් කරනු ලබන ඕනෑම අවස්ථාවක දැනුම්දීමේ සංඥා ප්‍රදර්ශනය කළ යුතු බව.

160අ. මාර්ගයක් අළුත්වැඩියා කරනු ලබන ඕනෑම අවස්ථාවක, මාර්ගය පාවිච්චි කරන්නන්ගේ ආරක්ෂාව සඳහා දැනුම්දීමේ සංඥා හා රාත්‍රී කාලයෙහි පහන් ප්‍රදර්ශනය කරනු ලැබීමට සැලැස්වීම, ඒ අළුත් වැඩියාවන් කරන හෝ ඒ අළුත් වැඩියාවන් කරනු ලැබීමට සලස්වන තැනැත්තාගේ යුතුකම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ "මෝටර් රථය නවත්වා" යන වචන වෙනුවට "ඒ මෝටර් වාහනය නවත්වා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 164 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) යම් රථවාහන විධිමත් කිරීමේ කාර්ය සඳහා සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලයක් දරන්නාවූ පොලිස් නිලධරයකුගේ නියමයෙන් ; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "මෝටර් රථය රඳවා යාමට" යන වචන වෙනුවට "මෝටර් වාහනය රඳවා යාමට" යන වචන ආදේශ කිරීමෙන් ; තව ද

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උප වගන්ති එකතු කිරීමෙන් :—

"(4) පොලිස් නිලධරයකුගේ මතය අනුව මහා මාර්ග යක නවතනු ලැබූ හෝ තාවකාලිකව රඳවනු ලැබූ මෝටර් වාහනයකින්, හෝ යම් වස්තුවකින්, දෙයකින් හෝ

ද්‍රව්‍යයකින් යම් මහා මාර්ගයක හෝ පැති මඟක ගමනා ගමනයට යම් අවහිරයක් සිදුවන අවස්ථාවක, ඒ පොලිස් නිලධාරියා විසින් ඒ අවහිරයට හේතුවන මෝටර් වාහනය හෝ ඒ වෙනත් වස්තුව, දෙය හෝ ද්‍රව්‍යය ඉවත් කරනු ලැබීමට සලස්වා ඒ ඉවත් කිරීමේ වියදම අයිතිකරුගෙන් අයකරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ මෝටර් වාහනයක්, වස්තුවක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ඉවත් කරනු ලැබීමේදී සද්භාවයෙන් සිදු වූ යම් හානියක් සඳහා කිසිම පොලිස් නිලධරයකු අලාභ ගෙවීමට යටත් නොවිය යුතු ය.”.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තිය පහත දැක්වෙන පරිදි එයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

“(2) පොලිස් නිලධරයකුගේ මතය අනුව, මහා මාර්ගයක යම් ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක්, එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා වූ ආදායම් බලපත්‍රයෙහි සඳහන් කර ඇති යම් උපරිම පැටවුම් බර ප්‍රමාණයක් වේද, එම පැටවුම් බර ප්‍රමාණය ඉක්මවා බඩු ගෙන යන්නාවූ හෝ ඒ පොලිස් නිලධරයාගේ මතය අනුව යම් මහා මාර්ගයක් පාවිච්චි කරන්නකුට අනතුරුදායක වන ආකාරයකින් එහි පටවන ලද බඩු ගෙනයන්නා වූ හෝ අවස්ථාවක, ඒ පොලිස් නිලධරයා විසින් ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය රඳවා තබා ගැනීම ; සහ—

(අ) ඔහුගේ මතය අනුව, ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය සඳහා වූ ආදායම් බලපත්‍රයෙහි සඳහන් කර ඇති යම් උපරිම පැටවුම් බර ප්‍රමාණයක් වේද, එම ලොරිය හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය එම පැටවුම් බර ප්‍රමාණය ඉක්මවා බඩු ගෙන යන්නාවූ යම් අවස්ථාවක, එවැනි යම් අතිරික්ත බඩු හෝ එහි කොටසක් ඉවත් කිරීම හෝ ඉවත් කරනු ලැබීමට සැලැස්වීම සිදු කොට, ලොරියේ හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයේ අයිතිකරුට නැතහොත් ඒ බඩුවල අයිතිකරුට ඒ බඩු ආපසු දෙනු ලබනතුරු ඒවායේ ආරක්ෂා භාරය සහතික කරනු පිණිස අවශ්‍ය සියලුම පියවර ගැනීම ; හෝ

(ආ) කෙසේ වුව ද, මහා මාර්ගය පාවිච්චි කරන්නකුට අනතුරුදායක වන ආකාරයකින් ලොරියක හෝ

මෝටර් ට්‍රයිසිකල් වැනි රථයක බඩු පටවා ගෙන යන්නාවූ අවස්ථාවක, මහා මාර්ගය පාවිච්චි කරන්නන්ට අනතුරුදායක නොවන ආකාරයෙන් ඒ බඩු නැවත පැටවීමට සැලැස්වීම

කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 189අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**15.** පහත දැක්වෙන අලුත් වගන්තිය 189 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 189අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"ට්‍රේලරයේ හඳුනා ගැනීමේ අංකය.

189අ. යම් මහා මාර්ගයක ට්‍රේලරයක් ඇදනු ලැබූ යම් මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ට්‍රේලරයෙහි හඳුනා ගැනීමේ අංකයට අමතරව, එය ඇදනු ලැබ ඇත්තේ යම් මෝටර් වාහනයකට ද, ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංකය ද ට්‍රේලරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 193 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 193 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) මහා මාර්ගයක මෝටර් වාහනයක් හෝ එහි සවි කරනු ලැබූ යම් රෝදයක් හෝ සුදුසු තත්ත්වයක නොපවතින බව විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු තිබේ නම්, ඒ වාහනය නවත්වනු ලැබිය හැකි ය ; තවද,

(i) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති, රියදුරාට පහසු යම් සුදුසු ස්ථානයක දී වාහනය පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට වාහනයේ රියදුරාට ලිඛිත නියම යකින් විධාන කළ හැකි ය ; හෝ

(ii) ඒ පරීක්ෂණයේ කාර්යය සඳහා වාහනය රඳවා තැබිය හැකි ය ; තවද,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 215 ආ වගන්තිය ඇතුළත් කිරීම.

**17.** පහත දැක්වෙන අලුත් වගන්තිය 215අ වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 215ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තියේ (4) වන උපවගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ දණ්ඩනය.

215ආ. තම රියැදුරු බලපත්‍රය අත් හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නැතහොත් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තමා නුසුදුස්සකු බව ප්‍රකාශ කිරීමේ නියමයක් බලාත්මකව පවතිද්දී, කවර වූ හෝ අවස්ථාවක මෝටර් වාහනයක් මහා මාර්ගයක පැදවීමෙන් මේ පනතේ 137 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට යටත් විය යුතු ය.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක්" යන්නෙහි සිට "යටත් විය යුතුය" යන්න දක්වා වූ සියලුම වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"රුපියල් හත්සිය පනහකට නොඅඩු දඩයකටද, දෙවන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහසකට නොඅඩු දඩයකට සහ ඔහුගේ රියැදුරු බලපත්‍රය අත්හිටවනු ලැබීමට ද, තුන්වන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක්දහස් පන්සියය කට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියැදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද නැතහොත් මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනා ගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.";

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය" යන වචන වෙනුවට, "රුපියල් පන්සියයකට නොඅඩු දඩයකට ද, දෙවන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහස කට නොඅඩු දඩයකටද, තුන්වන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් එක් දහස් පන්සියය කට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියැදුරු බලපත්‍රය මාස හයක කාලයක් සඳහා අත් හිටවනු ලැබීමට ද යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තියේ "රුපියල් පන්සියයකට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් පන්සියයකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තියේ "රුපියල් එක්දහස කට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් එක්දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 219 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 220 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 220 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් පන්සියයකට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොඅඩු දඩයකටද, දෙවන වරට හෝ තද නන්තර වරදකරු කරනු ලැබීමක දී, රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට ද," යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසකට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ; තවද

(ඈ) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් එක් දහසකට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 221 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 221 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "III වන කොටසේ යම් විධිවිධානයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "IV වන කොටසේ යම් විධිවිධාන යක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "රුපියල් දෙසිය පනහ නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දෙසිය පනහකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 223 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 223 වන වගන්තියේ "රුපියල් එක් දහස නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තියේ "රුපියල් දෙසිය යක්" යන්නෙහි සිට එහි අවසානය දක්වා වූ සියලුම වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"රුපියල් දෙසිය පනහකට නොඅඩු දඩයකටද, දෙවන වරට වරදකරු කරනු ලැබීමකදී රුපියල් පන්සියයකට නොඅඩු දඩයකටද, තුන්වන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමකදී රුපියල් හත්සිය පනහකට නොඅඩු දඩයකට සහ ඔහුගේ රියැදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමටද යටත් විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 224 ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

**25.** 224අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 224 ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"නීතිය ක්‍රියාත්මක වීමෙන් රියැදුරු බලපත්‍ර අත්හිටුවීම.

**224ආ.** මෝටර් වාහනයක රියැදුරාට විරුද්ධව—

(අ) (i) අපරීක්ෂාකාරී හා නොසැලකිලිමත් රිය ධාවනය කිරීම ; හෝ

(ii) අධික වේගයෙන් රිය ධාවනය කිරීම ; හෝ

(iii) ජීවිත හානියට හෝ බරපතල හානි ඇති වීමට හේතු වූ හදිසි අනතුරක් සිදු කිරීම

පිළිබඳව නඩු පවරනු ලබන අවස්ථාවක හෝ

(ආ) ඔහු ජීවිත හානියට හේතු වූ හදිසි අනතුර කට සම්බන්ධ වන්නා වූ හා එම කාරණය විභාග කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකුට යොමු කරන ලද අවස්ථාවක,

ඒ වාහනයේ රියැදුරාගේ බලපත්‍රය අත්හිටුවනු ලැබීමට පොලීසිය විසින් කරනු ලබන ඉල්ලීමක්

මත, මහෙස්ත්‍රාත්වරයා විසින් නඩු කටයුතු හෝ විභාගය අවසන් වනතුරු බලපත්‍රය එසේ අත්හිටුවීමට තම අභිමතය අනුව අණ කරනු ලැබිය හැකි ය. ".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තියේ " නාගරික ප්‍රදේශය " යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 240 වන වගන්තිය සංශෝධනය කිරීම.

' " නාගරික ප්‍රදේශය " යන්නෙන්—

(අ) යම් මහා නගර සභාවක හෝ නගර සභාවක සීමා ඇතුළත පිහිටි යම් ප්‍රදේශයක්, හෝ ;

(ආ) මේ පනතේ කාර්ය සඳහා නාගරික ප්‍රදේශයක් ලෙස නියෝගයකින් ප්‍රකාශිත වෙනත් යම් ප්‍රදේශයක් අදහස් වේ. '.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

" දෙවන උපලේඛනය

| I<br>පනතේ වගන්ති | II<br>විධිවිධාන | III<br>දඩ මුදල<br>රු. ශත |
|---|---|---|
| 21 | ... හඳුනාගැනීමේ තහඩු ... ... ... | 100 0 |
| 22 | ... හඳුනාගැනීමේ තහඩුවල හැඩය ... ... | 100 0 |
| 38 | ... ආදායම් බලපත්‍රය මෝටර් වාහනවල ගෙන යායුතු අතර, නියම කරනු ලැබූ විට ඉදිරිපත් කළ යුතු බව | 100 0 |
| 45 | ... ආදායම් බලපත්‍ර කඩ කරමින් මෝටර් වාහන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් වූ සීමා කිරීම | 50 0 |
| 123 (1) (අ) | ... රියැදුරු බලපත්‍රයක් නොමැතිව රිය ධාවනය කිරීම තහනම් කිරීම | 150 0 |
| 123 (1) (ආ) | ... රියැදුරු බලපත්‍රය නොමැතිව තැනැත්තන් සේවා නියුක්ත කර ගැනීම | 150 0 |
| 123 (2) | ... වයස අවුරුදු 18ට අඩු රියැදුරු ... | 150 0 |
| 140 | ... අධික වේගයෙන් රිය ධාවනය ... ... | 200 0 |
| 148 | ... මාර්ග රීති ... ... ... | 100 0 |
| 152 | ... මෝටර් වාහනය ධාවනය කරන රියැදුරු සිටින ආකාරය ... | 100 0 |
| 153 | ... රිය ධාවනය කිරීම යනාදිය කරනු ලබන විට රියැදුරන් විසින් කළ යුතු සංඥ | 100 0 |
| 154 | ... මෝටර් වාහන පිටු පසට ධාවනය කිරීම ... ... | 20 0 |
| 155 | ... ශබ්ද හෝ ආලෝක මගින් අනතුරු ඇඟවීම ... | 100 0 |
| 156 | ... මෝටර් වාහනවල පා පුවරු යනාදියෙහි නැඟී යාම හෝ නැඟී යාමට අවසර දීම | 100 0 |
| 157 | ... මෝටර් රථවල ඉදිරිපස ආසනවල ගමන් කරන තැනැත්තන් ගණන | 100 0 |

| I<br>පනතේ වගන්ති | | II<br>විධිවිධාන | | III<br>දඩ මුදල |
|---|---|---|---|---|
| | | | | රු. ශත |
| 158 (2) | ... | ආරක්ෂිත හිස් වැසුම පැළඳීම පැහැර හැරීම | ... | 100 0 |
| 159 | ... | ප්‍රචාරක දැන්වීම් බෙදා හැරීම ... | ... | 100 0 |
| 162 | ... | පොලිස් නිලධාරීන් විසින් දෙන රථවාහන හැසිරවීමේ විධාන සහ සංඥා | | 150 0 |
| 165 | ... | ටැංකියට පෙට්‍රල් ලබාගන්නා විට ගත යුතු ආරක්ෂා විධි | ... | 20 0 |
| 166 | ... | මහා මාර්ගයේ මෝටර් වාහන නවතා තැබීම හෝ නවත්වා තැබීම | | 150 0 |
| 167 | ... | මහා මාර්ගයක මෝටර් වාහනයක් නවතා තබනු ලැබූ හෝ අනාරක්ෂිතව තබා යන හෝ ක්‍රියා විරහිත වූ විට, ගත යුතු ආරක්ෂා විධි | | 150 0 |
| 178 | ... | නියමිත ගණනට වඩා මගීන් ගෙනයාම ... | ... | 150 0 |
| 189 | ... | ලොරියක ගෙන යා හැකි තැනැත්තන් ... | ... | 150 0 ". |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.